**සංශෝධනයයි**

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ (ස්ථිර මාර්ග/පාලම්/ගොඩනැගිලි/කර්මාන්තශාලා/ධාවනාගාර/සංඥා හා විදුලි) නියාමක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024 (2025)**

අංක 2,418 හා 2025 ජනවාරි මස 03 වැනි සිකුරාදා දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර තිබූ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ (ස්ථිර මාර්ග/පාලම්/ගොඩනැගිලි/කර්මාන්තශාලා/ධාවනාගාර/සංඥා හා විදුලි) III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024(2025) යන නිවේදනයේ 1 වන හා 2 වන ඡේද පහත පරිදි සංශෝධනය වන බව මෙයින් නිවේදනය කරමි.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හැර 2025 ජනවාරි මස 03 වැනි දිනැතිව පළ වූ අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ල ම එලෙසම බලපවත්වන බව කරුණාවෙන් සලකන්න. මේ වන විට අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීමට අවශ්‍ය නොවන බව ද තවදුරටත් දන්වා සිටිමි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ පහත සඳහන් තනතුරුවල එම එක් එක් තනතුරට ඉදිරියෙන් දක්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා **2025.01.06** දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය **2025 වර්ෂයේ ජූලි මාසයේ දී** පැවැත්වීමට නියමිතව ඇත.

| | *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|---|
| 1. | අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) | III ශ්‍රේණිය | 64 |
| 2. | අධීක්ෂණ කළමනාකරු (පාලම්) | III ශ්‍රේණිය | 8 |
| 3. | අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) | III ශ්‍රේණිය | 28 |
| 4. | අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) | III ශ්‍රේණිය | 16 |
| 5. | අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) | III ශ්‍රේණිය | 23 |
| 6. | අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි) | III ශ්‍රේණිය | 30 |

02. ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams/E. B Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 අප්‍රේල් මස 11 වැනි දින පෙ. ව. 9.00**ට විවෘත වන අතර **2025 අප්‍රේල් මස 21 වැනි දින රාත්‍රී 9.00**ට අවසන් වේ.

දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

ජේ. අයි. ඩී. ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2025 අප්‍රේල් මස 07 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
අංක 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

04-126